අකුරණ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රිකය

1. මූල්‍ය ප්‍රකාශන.
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.
------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
---------------------------------------

1.3.1 නොසැසඳු පාලන ගිණුම්.
------------------------

රු.3,007,070 ක වරිපනම් ගිණුමේ ශේෂය රු.2,829,656 ක් වූ උපලේඛනයේ ශේෂය සමග සැසඳීමේ දී, රු.177,414 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

1.3.2 ලැබියයුතු ගිණුම්.
-------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.30,606,703 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.1,113,579 ක් වී තිබුණි. මෙම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.1,112,339 ක් තවදුරටත් අය වියයුතුව පැවතුණි.

1.3.3 ගෙවියයුතු ගිණුම්.
--------------------

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.33,398,969 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.2,443,126 ක් විය. එම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.2,306,851 ක ශේෂයක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.
----------------------------------------------

පහත සඳහන් නීති, රිති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| මු.රෙ.571(2) | අවස්ථා 92 කට අදාළ රු.2,604,823 ක ඉකුත් තැන්පතු සම්බන්ධව යොමුගත රෙගුලාසිවලට අනුව කටයුතු කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය.

-------------------------------------------

| | |
|---|---|
| xxiv පරිච්ඡේදයේ 44 ඡේදය | මිය ගිය නිලධාරියෙකුගෙන් වසර 06 ක කාලයක් ඉක්මවා ගොස් තවදුරටත් අය වියයුතු රු.39,875 ක ආපදා ණය ශේෂයක් දක්නට ලැබුණි. |
| (ඇ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් නිවේදනය | 2009 සිට 2014 කාල පරිච්ඡේදය තුළ අනුමත ගොඩනැගිලි අයදුම්පත් 419 කින් 381 කට අනුකූලතා සහතික ලබා ගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය.

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,464,938 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,441,897 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.1,023,041 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 ආදායම් පරිපාලනය.

--------------------

2.2.1 වරිපනම් හා බදු.

-----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.2,809,911 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.5,896,100 ක් විය. වර්ෂයේ හිගයෙන් හා බිල් කිරීම්වලින් අය කිරීමේ ප්‍රතිශතය සියයට 72 ක් වූ බැවින්, 2014 දෙසැම්බර් 31 දිනට අය වියයුතු මුදල රු.3,007,071 ක් විය. මෙම ශේෂය අය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159(1) වගන්ති ප්‍රකාර 2014 ජූනි 30 දින දක්වා කටයුතු කර නොතිබුණි.

ii. බල ප්‍රදේශය තුළ වර්ෂයකට රු.2,000 ට වඩා වැඩි වටිනාකම් ඇති වරිපනම් ගෙවියයුතු බදුකරුවන් 47 දෙනෙකුගෙන් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාල පරාසයක වූ රු.278,428 ක හිග වරිපනම් බදු අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.59,333 ක් හා මුද්දර ගාස්තු රු.9,043,140 ක් ලැබියයුතුව පැවති අතර, මින් 2015 ජූනි 30 දිනට රු.4,116,755 ක් අය වියයුතුව තිබුණි.

2.2.3 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

---------------------------------------

සභා බල ප්‍රදේශයේ ඉදි කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 10 කට අදාළ සමාගම්වලින් සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ආදායම් රු.30,000 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 දැන්වීම් පුවරු ගාස්තු

---

රු.366,200 ක් වටිනා ස්ථාවර දැන්වීම් පුවරු 12 ක් සඳහා ගාස්තු අය කර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

---

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයෙන් 2014 වර්ෂයේ රු.4,000,000 ක මුදලක් ලැබී තිබුණු අතර, එම මුදලින් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණේ රු.1,748,485 ක් පමණි. එය ලැබූ මුදලින් සියයට 43.7 ක් වී තිබුණි.

(ආ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් පන්සල්තැන්න ජනපදයේ හා හපුගොල්ල අක්කර 06 ජනපදයේ විලාන උඩුගම ග්‍රාමයේ ඉදි කළ ප්‍රජාශාලාවන් 02 ට අයත් ඉඩම් එම කොමිෂන් සභාවෙන් ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

---

සභාව සතු අංක 49-5805 හා අංක 49-8522 දරන ට්‍රැක්ටරයක් හා ට්‍රේලරය වසරකට අධික කාලයක සිට ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය.

---

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මඩුගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම.

---

I. මාර්ග තලයේ කැඩී බිඳී ගිය කොන්ක්‍රීට් කොටස් ගලවා ඉවත් කර, ABC මිශ්‍රනය යෙදීමට ඇස්තමේන්තු කර ඇතත්, එම වැඩ අයිතමයන් ඉටු නොකර තිබිය දී, ඒ වෙනුවෙන් රු.13,248 ක් ගෙවා තිබූ බව 2015 ජුනි 02 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

II. මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද 14.10 m x 2.45 m x 0.125 m කොටසක් (ඝන මීටර් 4.32 ක්) ඉටු කර නොතිබිය දී, කාර්මික නිලධාරි විසින් සාවද්‍යව නිර්දේශ කර, ෂටරින් ගැසීම, වැලි හා ගල් ප්‍රවාහනය ඇතුළු ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.68,290 ක මුදලක් ගෙවා තිබූ බව 2015 අගෝස්තු 28 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) කොනකලගල කනත්ත පාර ආරක්ෂිත පැති බැම්ම ඉදි කිරීම.

---

I. ආරක්ෂිත බැම්මේ අත්තිවාරම 1:3:6(1 ½ ) මිශ්‍රණයෙන් 7.5 m x 1.06 x 0.30 m ක ප්‍රමාණයෙන් කොන්ක්‍රීට් කර ඒ වෙනුවෙන් ගෙවීම් කර ඇතත්, අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා 7.5 m x 1.06 x 0.15 m ක ප්‍රමාණයක් ඉදි කර තිබුණු බව 2015 ජුනි 02 දින කරන ලද භෞතික

පරික්ෂණයේදී නිරීක්ෂණය විය. මේ සඳහා ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.13,510 ක් ගෙවා තිබුණි.

II. ආරක්ෂිත බැම්ම 1:5 සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් 6"x9" කළු ගල් යොදා ඉදි කිරීමට ඇස්තමේන්තු කර, ඊට අදාළව ගෙවීම් කර ඇතත්, අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වල බදාම මිශ්‍රණයකින් 12"x12" ට වඩා වැඩි ප්‍රමාණයේ කළු ගල් මිශ්‍රව ඇස්තමේන්තු ප්‍රමිතියට පටහැනිව ඉදි කර තිබූ බව 2015 ජූනි 02 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

III. ඇස්තමේන්තු ප්‍රමාණයන්ට හා ඉදි කිරීමේ සම්මත ප්‍රමිතීන්ට අනනුකූලව ඉදි කර නොතිබීම හා අගල් ½ ක විවරයක් සිටින සේ බැම්ම පුපුරා ඉරි තලා ගොස් තිබීම හේතුවෙන්, ඒ වෙනුවෙන් 2014 දෙසැම්බර් 09 දින වැය කළ රු.148,109 ක මුදල නිෂ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

(ඇ) රතුකොහු දිගල ගල්ලන මුදුන මාර්ගය ඉදි කිරීම.
--------------------------------------------------------

රු.493,448 ක මුදලකට ඇස්තමේන්තු කර, පෞද්ගලික ඉඩමක් හරහා විහාරස්ථානයකට පිවිසීමට ඉදි කිරීම් සැළසුම් කළ මාර්ගයේ, ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි. මාර්ගයේ ගස් ගළවා පස් කැපීම පමණක් ඉටු කර, ඒ වෙනුවෙන් 2014 දෙසැම්බර් 09 දින රු.140,411 ක් ගෙවීම් කර ඇතත්, 2015 ජූනි 02 දින විගණන පරීක්ෂණ අවස්ථාව වන විට මාර්ගය ඉදි කිරීම අත හැර දමා තිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
------------------------------------

සභා බල ප්‍රදේශයේ දිනකට කසළ ටොන් 4 ½ - 5 ත් අතර ප්‍රමාණයක් එකතු වන අතර,. එකතු වන කසළවලින් ටොන් 1 ½ ක් පමණ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගෙන තිබුණි. අනෙකුත් කසළ වර්ගීකරණයකින් හා කළමනාකරණයකින් තොරව යාක්ගහවෙල කොම්පෝස්ට් අංගනය අසළ වළකට බැහැර කරන බව 2015 ජූනි 02 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.
------------------------------------------

4.1 සංයුක්ත සැළැස්ම
---------------------

සමාලෝචිත වර්ෂයේදී සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදන සැළැස්ම.
--------------------------

රු.82,775,815 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

4.3 ක්‍රියාකාරී සැළැස්ම.
----------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය.
-----------------------

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.5** **අයවැය පාලනය.**

**-------------------**

**සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 05 ක සියයට 15 සිට සියයට 55 ක් දක්වා ද, වියදම් විෂයයන් 03 ක සියයට 14 සිට සියයට 82 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වු අතර, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.**

**5.** **පද්ධති හා පාලනය.**

**--------------------**

**පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ)** **ගිණුම්කරණය**
**(ආ)** **අයවැය පාලනය.**
**(ඇ)** **ආදායම් පරිපාලනය.**
**(ඈ)** **කොන්ත්‍රාත් පරිපාලනය.**
**(ඉ)** **වත්කම් කළමනාකරණය**